**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතය - 2025**

---

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 111 ක නැවතුම් පහසුකම් ලබා ගන්නා ආයතනයක් රු.2,664,000 ක මුදලක් (8,000x3x11) ආරක්ෂිත තැන්පත් ලෙස ගෙවිය යුතු වුවද තැන්පතු කර තිබුනේ රු.1,584,000 ක් පමණි. රු.1,080,000 ක හිග මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි. | නවම් මාවත රථ ගාලේ නැවතුම් පහසුකම් ලබා ගන්නා පෞද්ගලික මූල්‍ය ආයතනයක් ආරම්භයේදී වාහන 66 ක් සඳහා ආරක්ෂිත තැන්පතු මුදල් මණ්ඩලය වෙත බැර කර ඇත. ඉන් පසුව අළුතින් වාහන 45 ක ප්‍රමාණය ඇතුලත් වූ අතර, ඒ සඳහා අයවිය යුතු ආරක්ෂක තැන්පතුව වන රු.1,080,000 මුදල අයකර ගැනීම සඳහා ආයතනයේ මේ සම්බන්ධව කටයුතු කරන නිලධාරියා විද්‍යුත් තැපැල් මගින් (email) හා දුරකථන මාර්ගයෙන් දැනුවත් කළ අතර ඔවුන් විසින් කඩිනමින් මෙම මුදල් ගෙවීමට ක්‍රියා කරන බව දන්වා ඇත. | අයවිය යුතු ආරක්ෂිත තැන්පතු අයකර ගැනීමට හා මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමටද ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | විශ්‍රාම ගොස් ආසන්න වශයෙන් වසර 1.5ත් වසර 17 ත් අතර කාලයක් ගතවී ඇති නිලධාරීන් 06 දෙනෙකුට අදාල ණය නොවන අයවිය යුතු මුදල් ශේෂය රු.108,415ක් හා විශ්‍රාම ගොස් වසර 1.5 ත් වසර 4 ත් අතර කාලයක් ගතවී ඇති නිලධාරීන් 04 දෙනෙකුට අදාලව අය විය යුතු රු.3,211,035ක ණය ශේෂය 2025 දෙසැම්බර් 31 දිනට වන විටත් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගැනීම සඳහා අංශ ප්‍රධානීව ලිඛිතව දැනුවත් කර ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරන තීරණවලට අනුකූල නොවීම්

| | නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන් ගේ භාර අරමුදල් මණ්ඩල පනත | | | |
| (i) | 16(1) වගන්තිය | සේවා නියුක්තයා උපයන මුළු ඉපයීම්වලින් සියයට තුනක් පමණ වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවායෝජකයා විසින් අරමුදලට ගෙවිය යුතු වුවත්, 2001 ත් හා 2019 ත් අතර කාලයේදී මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද ඇඟලුම් කර්මාන්තශාලා 20 ක් ආරම්භයේ සිට ද, පිරිසිදු කිරීමේ පහසුකම් සපයන ආයතන 15 ක් ද, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල හෝටල් සහ ආපනශාලා ආයතන පිළිවෙලින් 29 ක් හා 12 ක් 2025 වර්ෂය සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. එම ආයතන අතරින් ආයතන 51 ක් ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා ද ලක්කර නොතිබුණි. | දායක මුදල් නොගෙවන ආයතන රාශියක් නිරීක්ෂණය වන අතර එම ආයතන වලින් දායක මුදල් ලබාගැනීමට ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදුකිරීම්, ලිඛිත දැනුවත් කිරීම, නීති ක්‍රියාමාර්ගයන්ට එළඹීම ආදී ක්‍රියාමාර්ග ගනිමින් පවතී. වසර කිහිපයක සිට කාර්ය මණ්ඩල හිඟතාවය, ආයතන ලිපිනයන් තුළ භෞතිකව නොපැවතීම, ආයතන අක්‍රිය වී තිබීම ආදී ගැටළු පවතින අතර, මෙම කටයුතු ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යෑමට අවශ්‍ය යාන්ත්‍රණයක් සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරමින් පවතී. | පනතේ නියමයන් ප්‍රකාරව අදාල ආයතන සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් හඳුන්වාදීමටත්, දායක මුදල් ගෙවා නොමැති සියලු ආයතනවලින් දායක මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) | 16.3 වගන්තිය | සේවායෝජකයින් විසින් මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කල යුතු වුවද, 2026 අප්‍රේල් 27 දින වනවිට 1981 සිට 2024 වර්ෂය දක්වා සේවායෝජකයින් 6612 විසින් මණ්ඩලය වෙත බැර කරන ලද රු.මිලියන 911.27 ක මුදලක් එලෙස බැර කර නොතිබුණි. මේ තුළ 2015 සිට 2024 වර්ෂය දක්වා කාලයට අදාළව සාමාජිකයින් | 2026 මැයි 20 දිනට විභජනය නොකළ මුදල් ශේෂය රු.876,405,047 කි. ඉදිරියේ දී මෙම තත්ත්වය අවම කිරීමට දායක මුදල් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රේෂණය කිරීම අනිවාර්ය කිරීම හා Form II Text File මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීම අනිවාර්ය කර ඇත. | පනතේ නියමයන් ප්‍රකාරව දායක මුදල් සාමාජික ගිණුම්වලට විභජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 6,211 ක් සඳහා රු.මිලියන 896.74 ක මුදලක් පැවතුණි. | | |
| (ආ) 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021 (ii) චක්‍රලේඛයේ 03 ඡේදය | සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 90 ක් හිමි කරගෙන මණ්ඩලය එය පරිපාලිත සමාගමක් බවට පත් කරගෙන තිබුණද චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාලාවක් මෙතෙක් පිළියෙල කර නොතිබුණි. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට (SLIDA) සීමාසහිත ලංකා ලුණු සමාගම (පරිපාලිත සමාගම) සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීමට අවශ්‍ය කාර්යය ලබාදී ඇති අතර වර්තමානය වනවිට එහි කටයුතු සිදුවෙමින් පවතී. | ප්‍රතිපත්ති මාලාව සැකසීම් කටයුතු කඩිනමින් නිමකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021 (iii) චක්‍රලේඛයේ 02 ඡේදය | | | |
| (i) | මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලබාගෙන නොතිබුණි. | මණ්ඩලයේ මෙහෙයුම් කාර්ය පටිපාටිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) සහයෝගය සහිතව යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති අතර අනුමත කරන ලද මූල්‍ය ක්‍රියාපටිපාටි අත්පොත 2022 ජුනි 23 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 20 ඡේදය | සේවක වර්ගීකරණය අනුව ගෙවන ලද සංයුක්ත දීමනා මුදල සේවක මට්ටම අනුව ගෙවීමට චක්‍රලේඛය මගින් නියෝග කර තිබුණද, මණ්ඩලය ඊට අදාල නොවන ලෙස කටයුතු කර තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025හි 20වන වගන්තිය දක්වා ඇති පරිදි උපලේඛන අංක 111හි සඳහන් සේවක වර්ගීකරණය අනුව සංයුක්ත දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතියට යොමු කිරීමට තීරණය කර ඇත. | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව ගෙවීම් කර තිබේනම් ඒවා අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගත යුතුය. |
| (ඈ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| 2.4 (ආ) (iii) ඡේදය | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය මගින් ප්‍රතිලාභ යෝජනා ක්‍රම | පළමු ප්‍රසම්පාදනයේ දී දින වකවානු තීරණය නොකළ ද | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | |
|---|---|---|
| පිළිබඳ සාමාජිකයින් දැනුවත් කිරීමේ ක්‍රියාවලියට අදාල ප්‍රසම්පාදන කමිටුව විසින් පළමු රැස්වීමේ දීම ප්‍රළුල් ප්‍රචාරණය සිදුකළ යුතු දින, ආකාරය, ප්‍රසම්පාදන ලේඛන නිකුත් කිරීම, ලංසු යෝජනා භාර ගැනීම, අවසන් කිරීම, විවෘත කිරීම දින තීරණය කළ යුතු වුවද, රු.මිලියන 15ක් වැයකර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාලව එසේ කටයුතු කර නොතිබුණි. | විගණන ජේදයේ දක්වා ඇති කාර්යයන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමේ දී දින වකවානු ලබා දී ඇත. එම දෝෂය 2026 වර්ෂයේ සිට නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | නියමයන්ට පටහැනිව කටයුතු කළ නිළධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් නොවීමටත් වගබලා ගත යුතුය. |

**1.7** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 වර්ෂය තුළ මණ්ඩලය විසින් ගෙවූ පාරිතෝෂිත මුදල රු.34,507,000ක් වූ නමුත් ආයෝජනයන්ගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේ දී රු.43,821,000ක මුදලක් පාරිතෝෂිත ගෙවීම් ලෙස අඩු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයෝජනයන්ගේ තක්සේරු කළ හැකි ආදායම රු.9,314,000කින් සහ ආදායම් බදු වියදම, ආදායම් බදු වගකිම රු.1,303,960කින් අඩු වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව පාරිතෝෂිත ගෙවීම රු.34,507,000කි. 2025 වර්ෂයට අදාල පාරිතෝෂිත සඳහා සිදුකළ සැබෑ ගෙවීම එය වන බැවින්, එය ආදායම් බදු ගණනය කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත. | තක්සේරු කළ හැකි ආදායම් ගණනයේ දී නිවැරදි වටිනාකම අදාළ කරගත යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 11(I) වගන්තිය අනුව "තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයකින් හෝ ආයෝජනයකින් යම් තැනැත්තකුට ලැබෙන ආදායම ගණනය කිරීමේ දී, එම තැනැත්තා විසින් එම වර්ෂය තුළ දරන ලද තාක්දුරට වූ සහ එම ව්‍යාපාරයෙන් හෝ ආයෝජනයෙන් ආදායම ලබා ගැනීමේ දී දරන ලද තාක් දුරටවූ වියදම් අඩු කරනු ලැබිය යුතුය" 2025/2026 වර්ෂය සඳහා ආයෝජනයන්ගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී, මණ්ඩලය විසින් අරමුදලේ සාමාජිකයන්ගේ 5 ශ්‍රේණියේ දරුවන්හට ශිෂ්‍යත්ව දීමනා ලෙස ලබාදුන් රු.3,110,000ක් අඩු කර | 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව, සේවක සුබසාධනය ප්‍රධාන අරමුණක් වන බැවින්, එය ඉටු කිරීම සඳහා සාමාජික සේවා සැපයීම මණ්ඩලයේ නීතිමය වගකීමකි. ශිෂ්‍යත්ව ප්‍රතිලාභයක් ලබා ගැනීමට නම්, සාමාජිකයා ප්‍රතිලාභය ඉල්ලා සිටින මාසයට පෙර අඛණ්ඩ මාස 12ක සේ.නි.භා.අ.මණ්ඩලයේ දායකත්වය ගෙවා තිබිය යුතුය. මෙම ප්‍රතිලාභය ලබාදීම නිසා සාමාජිකයන් නියමිත වේලාවට දායක මුදල් ගෙවීමට උනන්දු වන අතර, එමඟින් මණ්ඩලයට ලැබිය යුතු ආයෝජන ආදායමද ප්‍රමාද වේ. ඒ අනුව, ශිෂ්‍යත්ව වියදම් සහ මණ්ඩලයේ ආයෝජන ආදායම | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයාගේ නීතිමය අවශ්‍යතාවයක් වන අතර එය සාමාජිකයන්ගේ දරුවන් හට ලබාදෙන ශිෂ්‍යත්ව මත රඳා නොපවතී. එම නිසා ආයෝජන ආදායම් ගණනය කිරීමේ දී පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇති අතර එය ආයෝජන ආදායම උත්පාදනයට අදාළ වියදමක් නොවීමෙන් මණ්ඩලයේ ආයෝජනයන්ගේ තක්සේරු කළ හැකි ආදායම රු.3,110,000කින් සහ ආදායම් බදු වියදම, ආදායම් බදු වගකීම රු.435,400 කින් අඩු වී තිබුණි. | අතර ඍජු සම්බන්ධතාවයක් (nexus) පවතින බැවින්, ශිෂ්‍යත්ව වියදම් බදු අරමුණු සඳහා අනුමත කළ හැකි (allowable) වියදම් ලෙස සැලකිය යුතුය. | |
| (ඇ) | මණ්ඩලය විසින් 2025 වර්ෂය සඳහා මුද්දර ගාස්තුව ලෙස රු.292,550 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශයේ 01 කොටස පිරිවීමේ දී මණ්ඩලය විසින් සාධන පත්‍ර වර්ගය නිවැරදිව හඳුනාගෙන නොමැති අතර සියලුම මුද්දර ගාස්තු "වැටුප් ලදුපත්" කාණ්ඩය යටතේ දක්වා තිබුණි. | වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අදාල අවශ්‍යතාවය අනුව මුද්දර බදු අඩුකර ප්‍රේෂණය කර ඇති බවද අනෙකුත් අදාල ගෙවීම් සඳහා අදාල විධිවිධාන අනුව මුද්දර බදු නිසි පරිදි ගලපා ඇත. | සාධන පත්‍ර වර්ගය නිවැරදිව හඳුනාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 59,089 ක මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 58,899ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 55,200ක් හා රු.මිලියන 54,498ක් විය. ඒ අනුව සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 3,889 කින් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 4,401 කින් ඉහළ යාමක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ පොලී ආදායම රු.මිලියන 6,947 කින් ඉහළ යාම මේ සඳහා හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් සක්‍රීය සාමාජිකයින්ට ලබාදෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි රු.මිලියන 17.5 ක් වැය දරා 2025 වර්ෂයේ දී ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබූ අතර වියදමේ වැඩිවීම සියයට 45,340ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ මණ්ඩලය ඉපයූ ආදායමෙන් සාමාජිකයින් ලබාගෙන ඇති ප්‍රතිලාභ | 2025 වර්ෂයේ සිට මුළු දිවයිනම ආවරණය වන පරිදි සාමාජිකයන් දැනුවත් කිරිමට ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය භාවිතා කරනු ලැබේ. පෙර වර්ෂයන් වලදී මෙම ප්‍රචාරණයන් සඳහා අඩු දායකත්වයක් ලබාදීම තුලින් ප්‍රචාරණ වියදම් ඉහළ ගොස් නොමැති අතර පුළුල් ප්‍රචාරණයක් ලබාදීම සඳහා මෙසේ එකවර විශාල මුදලක් මණ්ඩලයට දැරීම තුලින් වියදම සියයට 45,340 කින් වැඩි වී ඇත. මෙම වියදම් තුලින් ලැබෙන ප්‍රතිලාභ එක් වර්ෂයක් තුලදී ඇගයීමට ලක් කළ නොහැකි අතර වර්ෂ ගණනාවක් පුරා | පසු විපරම් කටයුතු සිදුකර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර, අදාල ප්‍රගතිය ඇගයීම් පිළිබඳ වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිශතය පිළිවෙලින් 0.5 ක් හා 0.6 කි. ඒ අනුව සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා මණ්ඩලය අධික වැය දැරීමක් සිදුකර කඩිනම් ක්‍රියාමාර්ගයකට එළඹීම සිදුකර ඇතත්, වසර අවසානයේ දී ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ ප්‍රවණතාව පිළිබඳව විශ්ලේෂණයක් සිදුකර එහි ප්‍රගතිය හා ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධ ඇගයීමත් සිදුකර නොතිබුණි. | විහිදී යයි. මෙම ප්‍රචාරණයන් තුලින් ලැබෙන්නා වූ ප්‍රතිලාභ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක අගයක්ද ගනු ලබයි. මේ අනුව ඉදිරියේදී සමීක්ෂණයක් කිරීම තුලින් මණ්ඩලයට ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක අගයන් පිලිබද ඇගයීමක් සිදුකිරීමට බලාපොරොත්තු වේ. | |
| (ආ) | මණ්ඩලය සතු නවම් මාවත භූමි පරිශ්‍රයෙහි සවිකර තිබූ වෙළඳ දැන්වීම් පුවරු 2 න් එකක් 2016 වර්ෂයේ සිටද, අනෙක් ආයතනයේ දැන්වීම් පුවරුව 2022 වර්ෂයේ සිට ද, ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව අඛණ්ඩව එක් ආයතනයකට පිරිනමා තිබූ අතර, එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීමටද මෙතෙක් ක්‍රියාකර නොතිබුණි. | එම දැන්වීම් පුවරු සඳහා මුදල් අය කරගෙන පවත්වාගෙන ගියද,වාණිජ වටිනාකමක් සහිත මෙම භූමියේ එම අගය ප්‍රමාණවත් නොවන හෙයින් රජයේ තක්සේරු වටිනාකම මත මිල තීරණය කිරීමට යෝජනා විය. ඒ අනුව මණ්ඩලයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2026 ජනවාරි 12 දින රජයේ තක්සේරුව ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ලිපියක් යොමු කර ඇතත් තක්සේරු නිලධාරීන්ගේ හිගය මත මෙය කෙටි කාලයකින් නිමකළ නොහැකි විය. | විධිමත් තක්සේරු වාර්තාවක් ලබාගෙන ප්‍රසම්පාදනය හරහා ආයතනයට වඩා වැඩි ප්‍රතිලාභයක් ලබාගැනීමේ හැකියාව සොයාබලා ඒ අනුව කටයුතු කිරීමටත්, අදාල පාර්ශවය සමඟ ගිවිසුම්ගත වීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් 2011 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක කොටස් 761,478 ක් මිලට ගෙන ඇති අතර, 2025 දෙසැම්බර් 31 දිනට එහි වෙළඳපළ අගය රු.48,811,600 කි. 2020 සිට 2024 වර්ෂය දක්වා මෙම ආයෝජන සඳහා ලාභාංශ ලැබී නොමැති අතර 2025 වර්ෂයේ ලද ලාභාංශ මුදල රු.383,739කි. 2020 ත් 2025 ත් අතර කාල සීමාව තුළ මෙම සමාගම සම්බන්ධයෙන් මණ්ඩලය කොටස් වෙළඳපල ගනුදෙනුවලට අවතීර්ණ වී නොමැති අතර මෙම මුදල ඵලදායී ප්‍රතිලාභයක් ලැබෙන සමාගම්හි ආයෝජනය කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | ඉහත සමාගමේ ආයෝජනය දිගු කාලීන ආයෝජන කළඹ තුළ ඇති හෝටල් ක්ෂේත්‍රයට අයත් සමාගමකි. මෙම සමාගමේ ආයෝජනයෙන් 2011 සිට 2020 දක්වා ලාභාංශ ආදායම් ලෙස රු.මිලියන 24.16 ක් ලැබී ඇති අතර, 2011 සහ 2012 වසර වලදී මෙම සමාගමේ කොටස් විකුණා ප්‍රාග්ධන ලාභ ලෙස රු. මිලියන 18 ක් උපයා ගෙන ඇත. නමුත් 2020 වසරේ පැවති කොරෝනා වසංගත තත්වය සහ රටේ පැවති ආර්ථික අවපාතය නිසා සංචාරක හෝටල් ක්ෂේත්‍රය අලාභ ලබන තත්වයට පත් වූ බැවින් 2020 වසරේ සිට 2024 වසර දක්වා ලාභාංශ ප්‍රකාශයට පත් කර නැති අතර, 2025 වසරේ සිට නැවත සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවත් සමග එම සමාගම ද ලාභ ලබන තත්වයට පත්ව ඇති අතර, රු.383,739 ක ලාභාංශයක් ලැබී ඇත. ඉදිරි වසර වලද ලාභාංශ ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන අතර එම සමාගමේ කොටස් වෙළඳපොල | අරමුදල් ආයෝජනය කිරීමේ දී මණ්ඩලයට ඉහළ ප්‍රතිලාභලබාගත හැකි ආයෝජනවල අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මිළ ඉහළ අගයක් ගන්නා විට ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට අපේක්ෂා කරන බව. | |
| (ඈ) | මණ්ඩලය විසින් 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ කොටස් 3,302,188ක් රු.2,224,218,565ක පිරිවැය යටතේ මිල දී ගෙන තිබුණි. ඉකුත් වර්ෂ 5 තුළ මෙම කොටස් සඳහා ලැබූ ලාභාංශ ප්‍රමාණය ද රු.13,241,773කි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් 2008 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත විකිණීම නතර කර වසර 17ක කාලයක් ඉකුත්ව ගොස් තිබුණ ද මෙම කොටස් සඳහා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය දිගින් දිගටම පවත්වාගෙන යනු ලබයි. සාමාජිකයින්ගේ මුදලින් සමන්විත මෙම අරමුදලේ මුදල් දීර්ඝ කාලයක් තිස්සේ මෙලෙස පවත්වාගෙන යාමෙන් සාමාජිකයින්ට හිමිවන ප්‍රතිලාභ මට්ටම කෙරෙහි බලපෑමක් සිදු වී තිබුණි. | 2008 පෙබරවාරි 25 දිනැති ලිපිය මගින් Sri Lanka Telecom ආයතනයේ කොටස් රජයේ හිමිකාරිත්වය කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින් මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව විකිණීම නොකරන ලෙසට මහා භාණ්ඩාගාරයෙන් ලිඛිත උපදෙස් ලැබී ඇති බැවින් වෙළඳපොලේ ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීම නතර කරන ලදී. මෙම කොටස්වල සත්‍ය පිරිවැය රු.110,340,299.24 ක් වූ අතර කොටසක සත්‍ය පිරිවැය රු.33.41 ක් විය. SLT සමාගමේ 2026 අප්‍රේල් 30 දිනට වෙළඳපොළ මිළ රු.86.00 ක් විය. මෙම කොටස් 2026 පෙබරවාරි 02 දින රු.107.25 ක් ලෙසට ඉහළ වෙළඳ පොළ අගයකට ගණුදෙනු සටහන් වී ඇත. වසර 17ක කාලයක සිට එම කොටස් ප්‍රමාණය ප්‍රාග්ධන ලාභ නොමැතිව රඳවා තබා ගැනීමට මණ්ඩලයට සිදුව ඇත. | අරමුදල් ආයෝජනය කිරීමේ දී මණ්ඩලයට ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි ආයෝජනවල අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | චෙක්පත් එකතු කිරීමේ පහසුකම් ලබා දීම වෙනුවෙන් ලංකා බැංකුව හා මණ්ඩලය අතර 2006 අගෝස්තු 06 දිනැති ලිපිය ප්‍රකාරව ඇති වූ එකගතාවය අනුව රු.මිලියන 10 ක සහ රු.මිලියන 490 ක තැන්පතු දෙකක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලැබේ. අවුරුදු 20 කට ආසන්න කාලයක සිට පවත්වාගෙන යනු ලබන මෙම තැන්පතු සඳහා සාපේක්ෂව ඉහළ වෙළඳපොළ පොලී ලබා ගැනීමට මණ්ඩලය අවධානය යොමු කර නොතිබුණි. රු.මිලියන 500 වැනි මුදලක් අඛණ්ඩව මෙතරම් කාලයක් ලංකා බැංකුව තුළ රඳවා තබා ගැනීමේ දී මණ්ඩලයට ඉහළ ප්‍රතිලාභයක් | වාර්ෂිකව නැවත අළුත් කිරීමේ පදනම මත රුපියල් මිලියන 500 ක් ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිළදී ගැණුම්වල ආයෝජනය කර ඇත්තේ මණ්ඩලයේ ප්‍රධානතම දායක මුදල් රැස්කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාමේ පහසුව සඳහා ලංකා බැංකුව සහ මණ්ඩලය අතර ඇති වූ එකගතාවයක් අනුවය. මෙම එම ආයෝජනයන් වාර්ෂිකව අළුත්කරන (Renew) අවස්ථාවේදී ප්‍රතිමිළදී ගැනීම් හා ස්ථාවර තැන්පතු සඳහා රාජ්‍ය බැංකු 3 හි එම දිනට පවතින පොලී අනුපාතයක් සංසන්දනය කර වඩා වාසිදායක පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුවේ ආයෝජනය කරනු ලැබේ.<br>පහසුකම් සැපයීම වෙනුවෙන් රු.100,000 ක මාසික සේවා ගාස්තුවක් 2005 වර්ෂයේ සිට වර්තමානය දක්වා මණ්ඩලය විසින් ගෙවීම් කෙරේ. | මාසිකව රු.100,000 බැගින් සේවා ගාස්තුවක්ද ගෙවන බැවින් මණ්ඩලයට වඩා වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීමේ හැකියාව සොයා බලා ඒ අනුව සුදුසු ආයෝජන මාර්ගයක අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

ලබා ගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති මුළු ස්වයං රැකියා සාමාජික සංඛ්‍යාව 45,400 ක් වූ අතර සාමාජිකත්වය ලබා ඇති සංක්‍රමණික සාමාජික සංඛ්‍යාව 328 කි. ඉකුත් වර්ෂයේ මෙම සංඛ්‍යාව 44,494 කි. 2025 වර්ෂයේ දී ප්‍රාදේශීය කාර්යාල 16 කින් හා ප්‍රධාන කාර්යාලය මගින් බඳවා ගෙන තිබූ සාමාජික සංඛ්‍යාව 1226 ක් වූ අතර, අනුරාධපුර, බදුල්ල, ගාල්ල, යාපනය, මහනුවර, රත්නපුර සහ වව්නියාව යන කාර්යාල මගින් බඳවාගෙන තිබූ සාමාජික සංඛ්‍යාව 30 ට අඩු සංඛ්‍යාවක් විය. අක්‍රිය ස්වයංරැකියා හා සංක්‍රමණික සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසානයට 26814 ක් හා 162 ක් විය. අක්‍රිය ස්වයංරැකියාලාභී සාමාජිකයින් 500 ක් ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීම සඳහා වර්ෂය තුළ සැලසුම කර තිබුණද, සාමාජිකයින් 195 ක් හෙවත් සියයට 39 ක් පමණ සක්‍රිය කරගෙන තිබුණි. | සක්‍රිය සාමාජික දායකත්වය වර්ධනය කර ගැනීම සඳහා ක්‍රමෝපායන් ඇතුළත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට ලිඛිතව අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත. මේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට උපදෙස් ලබා දී ඇත. | සාමාජිකත්වය වර්ධනය කර ගැනීමට ක්‍රමෝපායන් දියත් කළ යුතුය. |
| (ආ) | සාමාජිකයන්ගේ අ.පො.ස. (උ.පෙළ) සමත් දරුවන් වෙනුවෙන් තෝරාගත් වෘත්තීය පාඨමාලා 100 ක් අතුරින් රු. 50,000 කට උපරිමයකට යටත්ව එක් පාඨමාලාවක් හැදෑරීමට අවස්ථාව ලබා දීමට තීරණය කර තිබුණි. සිසුන් 840 ක් දෙනෙක් වෙනුවෙන් රු.මිලියන 42 ක මුදලක් 2023 වර්ෂයේ සිට ගෙවීමට වාර්ෂික අයවැය මගින් වෙන්කර තිබුණද 2023/2024 වර්ෂවලදී ලද අයදුම්පත් සංඛ්‍යාව 373 ක් වීමෙන් හා 2024/2025 වර්ෂවලදී එම සංඛ්‍යාව 84 ක් වීමෙන් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනිමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. | නිපුණතා සවිය සහ විශ්ව යාත්‍රා යෝජනා ක්‍රමයන් හඳුන්වා දීම් හරහා තෝරාගත් දරුවන් සඳහා ලබාදෙනු ලබන ප්‍රතිලාභ මුදල වැඩිකර ඇති අතර, විද්‍යුත් මාධ්‍යය, මුද්‍රිත මාධ්‍යය මෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා මෙම යෝජනා ක්‍රමය පිළිබඳ සාමාජිකයින්ගේ දැනුවත් බව වැඩි කිරීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේදි මේ පිළිබඳව පුළුල් දැනුවත් කිරීම් කිරීමට අපේක්ෂා කෙරේ. දිගුකාලීන වශයෙන් වැඩි දූ දරුවන් පිරිසක් මේ සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. | අරමුණු ඉටුකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග වර්ධනය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2025 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති මුළු සේවායෝජක සංඛ්‍යාව 235,624 ක් වුවත්, ඉන් සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසානයට 84,491 ක් හෙවත් සියයට 35.8 කි. සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හා නව සේවායෝජකයින් හඳුනා ගැනීමට මණ්ඩලය ගනු ලබන ක්‍රියා මාර්ග තවදුරටත් වර්ධනය කරගත යුතු බවට විගණනයේ දී නිරීක්ෂණය විය. | සාමාජික ප්‍රමාණය වර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු මණ්ඩලයේ වෙබ් පිටුව, දේශීය පුවත්පත් මගින්, ප්‍රචාරක වැඩසටහන් මගින් හා සේවාදායකයන් දැන්වීම් තැපැලෙන් ලබාදීම තුළින් අදාල ප්‍රචාරණයන් සිදුකර ඇත. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල හරහා අවුරුදු 05 පුරා විහිදෙන ක්‍රමවත් සැලැස්මක් සකස් කිරීමෙන් පසු සක්‍රීය සේවායෝජක සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හා නව සේවායෝජකයින් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. | ලියාපදිංචි වී ඇති සේවායෝජකයින්ගේ සක්‍රීයභාවය කාලීනව සොයා බැලීමට ක්‍රමවේදයක් හඳුන්වාදී, එය කාලීනව යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) | 2016 අගෝස්තු 26 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ දී මණ්ඩලයේ සභාපති හා විධායක නිලධාරී තනතුර එකම පුද්ගලයකු දැරීම, පනත් සංශෝධනය මගින් වෙනස්කළ යුතු බවට නියෝග කර තිබුණද, වසර 08 ක කාලයක් ඉකුත්ව ගොස් ඇතත් එම කාර්යය කඩිනම් කර සංශෝධනය කර ගැනීමට අපොහොසත් වී ඇත. | පනතේ 5(2) වගන්තිය සංශෝධකය සඳහා 2021 වර්ෂයේ සිට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර වර්තමානය වන විට මණ්ඩලයේ යෝජිත සංශෝධිත පනත් කෙටුම්පතට අදාල ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීම සඳහා අදාල ලේඛන මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස 2025 ඔක්තෝබර් 14 දින දන්වා තිබුණි. ඒ අනුව අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය 2025 නොවැම්බර් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබ 2025 දෙසැම්බර් 17 දින අදාල කෙටුම්පත් සංදේශය මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | කඩිනමින් ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නවම් මාවත රථගාලේ වාහන නැවතුම්කරුවන්ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ශේෂ වටිනාකම රු.6,858,325 ක් වූ අතර මේ තුළ දින 90 ක් ඉක්මවා ඇතත් නොගෙවූ ශේෂ වටිනාකම රු.3,950,000 කි. මාසික කුලී පදනම මත රථවාහන ගාල් කරන ආයතන 78 ක් පැවතියද එක් ආයතනයක් සමඟ පමණක් මණ්ඩලය ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර තිබුණි. | හිඟ වාරික නිර්මාණය වීම වැළැක්වීම සඳහා ඉදිරියේදී එක් මසක් ආරම්භයේදී ගෙවීම් සිදු කර මෙම නැවතුම් පහසුකම් සඳහා පෙර ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් මඟින් නැවතුම් පහසුකම් ලබා ගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරීමට අපේක්ෂා කරන බව. | මාසික කුලී පදනම මත රථ වාහන ගාල් කරන සියලු ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමටත්, අයවිය යුතු සියලු කුලී අයකර මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී ඇති නොවීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2025 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ වටිනාකම ප්‍රතිලාභීන් 1,327 කට අදාලව රු.මිලියන 29.5 ක් හා ඉකුත් වර්ෂයේ එම ශේෂය ප්‍රතිලාභීන් 1,295 කට අදාලව රු.මිලියන 27.9ක් සාමාජිකයන්ගේ උරුමකරුවන්, යැපෙන්නන් හා නාමිකයන්ගේ තොරතුරු යාවත්කාලීන කර අදාල ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉහත ශේෂයෙන් 2026 වර්ෂයේ දී 09 දෙනෙකුට අදාලව රු.742,217ක් නිදහස් කර ඇත.<br>මෙම ගිණුම් ශේෂයන් ඇති වන්නේ, අප මණ්ඩලයේ මිය ගිය සාමාජිකයින්ට අයත් සාමාජික ගිණුම් ශේෂය ගෙවීම් කිරිමේ දී, මිය ගිය අයගේ උරුමකරුවන් හෝ නාමිකයන් සියල්ලම ප්‍රතිලාභ මුදල් ඉවත් කර ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකිරීම නිසාය. බොහෝමයක් උරුමකරුවන් හෝ නාමිකයන් පිළිබඳ පෞද්ගලික තොරතුරු අප සතුව නොමැති වීම මෙන්ම, ඔවුන් විදේශ ගතව සිටීම යන හේතූන් මත වාර්ෂික හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ශේෂය ක්‍රමයෙන් වැඩි වී ඇත. වාර්ෂිකව මෙම ශේෂය ඉහළ ගිය ද මියගිය සාමාජිකයින්ගේ උරුමකරුවන් කිහිපදෙනෙකුට හෝ ප්‍රතිලාභ භුක්තිවිඳීමේ අවස්ථාවක් මෙමගින් හිමි වේ. | කඩිනමින් සාමාජිකයින්ගේ උරුමකරුවන් හා යැපෙන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කර අදාල ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2025 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 9.029 ක් වූ අතර ඒ තුළ වර්ෂ 2001 ත් 2024 ත් අතර කාල පරාසයට අයත් වටිනාකම රු.මිලියන 4.6 ක් විය. මෙම ශේෂ නිරවුල් කිරීමට හෝ නැවත සාමාජික ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2026 අප්‍රේල් 30 දින වන විට ප්‍රතිලාභීන් 40 දෙනෙක් සඳහා රු. 3,374,534.75 ක මුදලක් ගෙවා ඇත. තවදුරටත් ප්‍රතිලාභීන් 448 දෙනෙක් සඳහා රු. 5,654,629 ක ශේෂ පවතී. ප්‍රතිලාභීන්ට දුරකතන පණිවුඩ ලබා දීමෙන් සහ ලිපි යැවීම තුලින් එම මුදල් නිදහස් කිරීමට සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම සහ ප්‍රතිලාභීන්ගේ උනන්දුවක් නොමැතිවීම නිසා මෙම මුදල් නිදහස් කිරීමට අපොහොසත් වී ඇත. ප්‍රතිලාභීන් 448 දෙනා අතුරින් 280 දෙනෙකු එනම් 60%ක ප්‍රමාණයකගේ මුදල් වල වටිනාකම් රු. 5,000.00 ට වඩා ශේෂයන් නිරූපණය කෙරේ. ප්‍රතිලාභින්ට දුරකථන ඇමතුම් ලබා දෙමින් මේ පිළිබඳව දැනුවත් කරමින් නිරවුල් කිරීම් සිදු කරනු ලැබේ. | කඩිනමින් අදාල ප්‍රතිලාභීන් හඳුනාගෙන ගෙවීම් කඩිනම් කිරීමටත් තොරතුරු සොයාගත නොහැකි ශේෂ සාමාජික ගිණුම්වලට බැර කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව පරිගණක පද්ධති ව්‍යාපෘති කටයුතු සඳහා 2023 වර්ෂයේ දී මිලදී ගනු ලැබූ මුළු වටිනාකම රු.2,478,000 ක් වූ QR Code Printers 21 ක් හා මුළු වටිනාකම රු.2,277,572 ක් වූ QR Code Scanners යන්ත්‍ර 44 ක් භාවිතයෙන් තොරව වසර තුන හමාරක් තිස්සේ ගබඩාවේ නිෂ්කාර්යව රඳවා තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. සැලසුම් කළ පරිදි නියමිත කාලසීමාව තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට නොහැකි විය. අදාල දෘඩාංග උපාංග මිළදී ගැනීම සිදුකළ යුතු බව ICTA ආයතනය මගින් දිගින් දිගටම අවධානයට ලක්කර තිබු බැවින් රේඛීය ආමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර ඇත. මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු මෙම යන්ත්‍රවල අවශ්‍යතාවය මතුවන අතර ඒ අනුව මේවා යොදාගැනීමට සැලසුම් කර ඇත. | අදාල ව්‍යාපෘති භාර නිලධාරීන් අදාල කාර්යයන් සිදුකර නොමැතිවීමට හේතු සොයා බලා අදාල ක්‍රියාමාර්ග ගැනීමටත්, අදාල වත්කම් නිශ්චිත අරමුණු සඳහා යොදා ගැනීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය සතු නවම් මාවත පිහිටා ඇති වර්ග අඩි 19319 කින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනට පිරිවැය වටිනාකම රු.මිලියන 21.41 ක්වූ දෙමහල් ගොඩනැගිල්ල කිසිදු ආයෝජන ආදායමක් ඉපයීම සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. | නවම් මාවතේ ඉඩමේ පිහිටි ගොඩනැගිල්ල රථගාලේ සේවක නවාතැන් පහසුකම් ඊට අදාල ගබඩා පහසුකම් සහ රථගාල සම්බන්ධ කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. ගොඩනැගිල්ලේ කොටසක වහලයක් සහිතව රථගාල් කිරීම අවශ්‍යතාවය මත රථගාල ලෙස භාවිතා කරනු ලැබේ. මේ වනවිට අප අරමුදල විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමග ගොඩනැගිලි හා ආයෝජන ව්‍යාපෘතියන් ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | අදාල ගොඩනැගිල්ල වඩා ඵලදායී ලෙස යොදා ගැනීමේ හැකියාවන් සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ කාර්යයන් හා සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිකිරීමේ අරමුණින් සාමාජිකයින් කේන්ද්‍රගත වූ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග ඒකාබද්ධව වසර 3 කින් නිමකිරීමේ අරමුණින් 2016 නොවැම්බර් මස අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්තමානය වනවිටත් | සැලසුම් කළ කාලය තුළ ව්‍යාපෘති කටයුතු අවසන් නොවීමට කොවිඩ් වාතාවරණය නිසා සිදුවූ ප්‍රමාද වීම, වෙනස් ඉල්ලුම් (CR) සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම, තවත් ප්‍රධාන වෙනස්කම් කිපයක් පද්ධතිය හා සජීවීව යාමට පෙර සම්පූර්ණ කළයුතුව තිබීම, OAT ආරම්භ කිරීමට පෙර පද්ධතිය පරික්ෂා කිරීමේදි පද්ධතිය තුල ගැටලු සහ දෝෂ ඇතිවීම හා ව්‍යාපෘතිය කළමණාකාරිත්වයේ ප්‍රධාන ලෙස බලපාන ලදි. ව්‍යාපෘතිය සඳහා තොරතුරු තාක්ෂණ උපදේශකයකු 2024 | පද්ධතිය සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග කඩිනම් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පද්ධතිය නිල වශයෙන් සජීවී ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිව පවතී. සැලසුම් කල කාලය තුල ව්‍යාපෘති කටයුතු නිම නොවීම මත තොරතුරු තාක්ෂණ උපදේශකයෙකුගේ සේවයද වසරක කාලයක් සඳහා ලබාගෙන ඒ සඳහා රු.2,400,000ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණු අතර 2025 දෙසැම්බර් අවසානය වනවිට ව්‍යාපෘතිය වෙනුවෙන් මණ්ඩලය දරා තිබූ මුළු වියදම රු.මිලියන 193 ක් විය. ව්‍යාපෘතිය සාර්ථකව අවසන් වී නොමැති බැවින් නව ගිවිසුමකට එළඹීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොතිබුණි. | වර්ෂයේ වසරකට කාලයකට බඳවා ගත් අතර මණ්ඩලයේ වත්මන් ව්‍යාපාර අවශ්‍යතාවය හා නව පද්ධතිය අතර පරස්පරතාවයක් ඇති බවත් ඒ හේතුවෙන් OAT ක්‍රියාවලිය ආරම්භ කිරීම සැලසුම් කළ පරිදි කළ නොහැකි බවත් හඳුනාගන්නා ලදි.<br>ව්‍යාපෘතියේ මෙහෙයුම් වගකීම අප මණ්ඩලයට පැවරීම සඳහා ICTA ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බැවින් අදාලව අනුමැතීන් ලැබීමෙන් අනතුරුව නව ගිවිසුමකට එළඹීමට අදාල කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව. | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියෝජ්‍යය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) තනතුරට 2021 වර්ෂයේ දී බඳවා ගනු ලැබූ නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේ දී ඔහුගේ සේවා පළපුරුද්ද සඳහා ලකුණු පිරිනැමීමට අදාල සේවා සහතික ගොනුගත කර නොතිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා තනතුරට 2021 වර්ෂයේ දී බඳවාගත් නිලධාරියාගේ සේවා පලපුරුද්ද සහතික කර ගැනිම සඳහා ඔහු කලින් සේවා කරන ලද සේවා ස්ථාන ප්‍රධානියා වෙත යොමු කළ ලිපියට පිළිතුරු ලිපියක් යොමු කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී. | සේවා සහතික ගොනුගත නොකිරීමට හේතු සොයා බලා ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1 – 10 ප්‍රකාරව පත්වීම් බලධාරියකු විසින් මොනම හේතුවක් නිසා හෝ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව පත්වීමක් පෙරදාතම නොකළ යුතු වුවත් 2020 සැප්තැම්බර් 01 දින සිට සහකාර පරිපාලන නිලධාරියෙකු ලෙස පත්වීම් ලද පුද්ගලයෙකුගේ තනතුරේ පත්වීම් දිනය 2016 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙර දාතම් කර තිබුණි. | 2020 සැප්තැම්බර් 01 දින පත්කරනු ලැබූ සහකාර පරිපාලන නිලධාරීගේ උසස් කිරීමේ දිනය පෙරදාතම් කිරීම නිවැරදි කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී. | ආයතන සංග්‍රහයේ නියමයන්ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් සොයා බලා ඒ අනුව වගකිව යුතු නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1.2 අනුව වැඩ බැලීමේ පත්වීම් සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියාට අනුමත බඳවා ගැනිමේ පරිපාටිය අනුව සැම අතින්ම සුදුසුකම් තිබිය යුතු වුවද, කණිෂ්ඨ | කණිෂ්ඨ කළමනාකරු මට්ටමේ නිළධාරියාට ලබා දී තිබූ කළමනාකරු (ප්‍රතිලාභ පරිපාලන) තනතුරේ වැඩ බැලීම නිවැරදි කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ ලැබී ඇති අතර ඒ අනුව ඉදිරියේ | ආයතන සංග්‍රහයේ නියමයන්ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් සොයා බලා ඒ අනුව |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරන මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක රාජකාරී ඉටු කරමින් සිටි නිලධාරියෙකුට 2021 දෙසැම්බර් 22 දින සිට කළමණාකරු, ප්‍රතිලාභ පරිපාලන තනතුරෙහි (MM 1-3) වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. | දී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කෙරේ. | වගකිව යුතු නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද 2025 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 05 ක් විය. සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) තනතුර 2023 වර්ෂයට පෙර සිටම පුරප්පාඩුව පවතින අතර, වර්තමානයේ අනුයුක්ත කාර්ය මණ්ඩලයෙන් නිලධාරීන් 03 දෙනෙකු පමණක් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ අංශ ප්‍රධානි විසින් අංශයේ ඉදිරි කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කර එහි සේවක අවශ්‍යතාවය මත ඉදිරි බඳවාගැනීම් සිදුකිරීමට අවශ්‍ය තොරතුරු පරිපාලන හා මානව සම්පත් අංශයට ලිඛිතව ලබාදීමට කටයුතු කිරීමට අපේක්ෂා කර සේවා පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ සාමාජිකයන්ට සේවා පහසුකම සැලසීම සඳහා සේවා කවුළු (Service desk) පිහිටුවීමට සැලසුම් කර තිබුණද, එය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම කාර්යය සිදුකිරීමට උපදේශකයෙක් තෝරගෙන ඇති අතර ඔහු සමග ගිවිසුම්ගත වීම සඳහා අදාල ගිවිසුම විශ්ලේෂණය කරමින් පවතී. එය අවසන් වූ විගසම කාර්යයන් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව. | සැලසුම් කරන ලද සේවා කවුළු පිහිටුවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත පරිපාලන හා මානව සම්පත් අංශයට අදාල සැලැස්මෙහි ඇතුළත් නව කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම හා නවම් මාවත වාහන නැවතුම් මධ්‍යස්ථානය සඳහා විද්‍යුත් ගේට්ටු පද්ධතියක් සැකසීම් කටයුතු මෙතෙක් ඉටුවී නොතිබුණි. | සමස්ත ආයතනයේ ක්‍රියාත්මක වන සියලුම කාර්යයන් හි කාර්යසාධන ඇගයීම් සලකා නව කාර්යසාධන දර්ශක පද්ධතියක් (KPI) සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ඉදිරියේදී අනුමැතිය ලබාගැනීමෙන් පසු කාර්ය සාධන ඇගයීම් පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලබයි. නවම් මාවත නැවතුම් මධ්‍යස්ථානය සඳහා විද්‍යුත් ගේට්ටු පද්ධතියක් සවිකිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නව කාර්යසාධන ඇගයීම් පද්ධතියට අදාලව අනුමැතීන් ලබාගෙන පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමටත්, විද්‍යුත් ගේට්ටු පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 වාර්ෂික වාර්තාව මගින් අනාවරණය කර ඇති පරිදි සාමාජිකයන්ට තම පෞද්ගලික ගිණුමේ ශේෂය කෙටි පණිවිඩයක් | ඍජුවම සාමාජිකයන් දැනුවත් කිරීම සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ දැනට e-service පහසුකම් සාමාජිකයන් වෙත ලබාදීමට පියවර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස | සාමාජිකයන් දැනුවත් කිරීම තුළින් සාමාජිකයින් අදාල සේවා |

| | | |
|---|---|---|
| මගින් දැනගැනීමට මණ්ඩලය පහසුකම් ලබාදී ඇති බව සඳහන්ව පවතී. සක්‍රීය සාමාජික සංඛ්‍යාව වූ මිලියන 2.6 න් වර්තමානය වනවිට මෙම සේවාව ලබාගැනීම සඳහා මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව 35,662 ක් බව විගණනය වෙත වාර්තා කර ඇත. ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමේ දී තමා සක්‍රීය සාමාජිකයෙකු ද යන්න දැනගැනීමේ පහසුකම් විද්‍යුත් සේවාව ඔස්සේ ලබාගැනීම සඳහා මෙම ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීම් තවදුරටත් වර්ධනය කළයුතු මට්ටමක පැවතුණි. | මාස 3ක කාලයක් තුල නව සාමාජිකයන් 1938 ක් ලියාපදිංචි වී ඇති අතර මෙය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල අංශ ලිඛිතව දැනුවත් කිරීමට පියවර ගනු ලබයි. මෙහි ප්‍රගතිය ත්‍රෛයිමාසිකව ලබාගෙන ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව. | ලබාගැනීම සඳහා ලියාපදිංචි කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 134(3) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන වාර්තා පිටපත් එලෙස ඉදිරිපත් කර නොතිබුණි. | 2026 වර්ෂයේ සිට නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් අභ්‍යන්තර විගණන කොට්ඨාශයට ලබාදී ඇති අතර නියමිත පරිදි අදාල වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි. | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත්, ඉදිරියේදී අදාල වාර්තා කාලීනව ලබාදීමටත් වගබලා ගත යුතුය. |
| (ආ) | අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලීය කාර්ය මණ්ඩල සඳහා දිරි දීමනා, ප්‍රසාද දීමනා, නිවාඩු දීමනා සම්බන්ධව පූර්ව විගණන කටයුතු සියයට සියයක්ම පරීක්ෂාවට ලක් කර තිබුණ ද මණ්ඩලයේ වත්කම් සියළු ආකාරයේ අලාභ හානිවලින් ආරක්ෂාවේ ද යන්න පරීක්ෂාවට ලක් කිරීම හා ස්ථාවර වත්කම් ලේඛනය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාව, මණ්ඩලයේ අංශයන්ට පවරා ඇති වගකීම ඉටු කිරීමෙහිලා ඔවුන්ගේ කාර්යසාධනය පරීක්ෂාව හා ප්‍රාදේශීය කාර්යාල ඇගයීම හා අවදානම් ලේඛනය යාවත්කාලීන කිරීම හා ඇගයීම් | 2026 වර්ෂයේ සිට ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දි ඇති කරුණු ඇතුලත්ව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර එය විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව විගණනයන් පැවැත්වීමට අදාලව උපදෙස් ලබාදි ඇත. එහි ප්‍රගතිය කාලානුරූපිව ජාතික විගණන කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කරනු ලබන බව. | අභ්‍යන්තර විගණනය විසින් ආවරණය කර නොමැති අංශ කෙරෙහි විශේෂ අවධානය යොමුකර අදාල අංශ ද පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාව ආදී කාර්යයන් ඉටු කර නොතිබුණි. | | |
| (ඇ) | 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 චක්‍රලේඛයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂයකට විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | 2026 වර්ෂයේ සිට නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. 2026 වර්ෂයේ පළමු කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා ඇති අතර දෙවැනි කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ රැස්වීම ජුනි මාසයේ පැවැත්වීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව කටයුතු කරමින් මෙම තත්ත්වයන් මගහරවා ගැනිමට ඉදිරියේ දී කටයුතු කළ යුතුය. |

**4.3 සයිබර් ආරක්ෂණ පියවර**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොරතුරු වත්කම්වල රහස්‍යභාවය, උපයෝජ්‍යතාවසහ විශ්වාසනීයත්වය සහතික කිරිම සඳහා ඒවා වෙත අනවසරයෙන් වන ප්‍රවේශ වීම්, වළක්වාලීම, වෙනස් කිරීම හෝ විනාශ කිරීම් වලින් තොරතුරු වත්කම් ආරක්ෂා කිරිම සඳහා හඳුන්වා දී ඇති සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට සියළුම රාජ්‍ය ආයතන අනුගතව කටයුතු කළ යුතු බව තාක්ෂණ අමාත්‍යාංශයේ 2023 මැයි 02 දිනැති අංක MOT/2023/01 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී තිබුණි. චක්‍රලේඛ නිර්ණායකවලට අනුකූලව මණ්ඩලය තුළ තොරතුරු ආරක්ෂණ කමිටු පිහිටුවීම, අවධානම් කළමනාකරණ කමිටු පිහිටුවීම, තොරතුරු වත්කම් ලේඛනය හා තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛනය පවත්වාගෙන යාම ආදී කටයුතු මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි. | මණ්ඩලය තුල තොරතුරු ආරක්ෂණ කමිටුව පිහිටුවීම, අවධානම් කළමනාකරණය කමිටුව පිහිටුවීමට අදාලව කෙටුම්පත් සකස් වෙමින් පවතින අතර අදාල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එය සිදුකිරිමට කටයුතු සූදානම් කරමින් පවතී. තොරතුරු වත්කම් ලේඛනය සකස් කිරිමට අදාලව උපදේශනයක් (SLCERT) වෙතින් අවශ්‍ය වන අතර ඉන් අනතුරුව මෙය සකස් කිරිමට සැලසුම් කර ඇත. වත්කම් ලේඛනය මේ වනවිට සකස් කරමින් පවතී. තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛණය කාර්යක්ෂමව ලබාගැනිමට, යාවත්කාලින කිරිමට හා පවත්වා ගැනිමට මෘදුකාංගයක් මිළදී ගැනිම සඳහා 2026 වර්ෂයට අයවැය ප්‍රතිපාදන ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව අවශ්‍ය කමිටු පත් කිරීමටත්, ලේඛන පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතුය. |